දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය - 2022

-----------------------------------------------------------------

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා අන්තර්ජාතික සංවර්ධන සමායතනය අතර 2019 අප්‍රේල් 11 දින එළඹි අංක 6346-LK දරන ණය ගිවිසුමේ III (ii) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන අතර අන්තර්ජාතික සංවර්ධන සමායතනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.
තෝරාගත් සංවේදී ස්ථානවල කුඩා වතුහිමියන්ගේ කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව සහ දේශගුණයට ඔරොත්තුදීමේ හැකියාව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. කෘෂිකාර්මික නිෂ්පාදනය සහ අලෙවිකරණය, කෘෂිකර්මාන්තය සඳහා ජලය සහ ව්‍යාපෘති කළමනාකරණය යන සංරචක තුනක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.
ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 25,200 කට සමාන වූ එ.ජ.ඩො මිලියන 140 වන අතර ඉන් රු. මිලියන 26,829 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 100ක් සැපයීම සඳහා අන්තර්ජාතික සංවර්ධන සමායතනය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 4,024.35 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2019 මැයි 07 දින ආරම්භ කරන ලද අතර, 2024 ජූනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ මතය අනුව, මාගේ වාර්තාවේ 2.1 වන වගන්තියේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2022 දෙසැම්බර් 31 දිනට දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරන අඩුපාඩුව | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ විදේශ ණය සම්බන්ධ විදේශ විනිමය ගැලපීම් සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම්ගත කර නොතිබූ බැවින් ණය ශේෂය මූල්‍ය තත්ත්වය ප්‍රකාශ දිනයේදී සාධාරණ වටිනාකම පිළිබිඹු නොකරයි. | **4,829** | අවසන් වාර්තාව සකස් කිරීමේදී මෙම කරුණ ඇතුළත් කර ඇති බැවින් කළමනාකාරීත්වයට අදහස් දැක්වීමට අවස්ථාවක් ලබා දී නොමැත. | විදේශ විනිමය අනුපාතවල වෙනස්වීම් අනුව විදේශ විනිමය ගැලපීම් ගිණුම්ගත කළ යුතුය. |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු.රෙ. 103 සහ 104 | මුදල් රෙගුලාසියට අනුව, 2022 දෙසැම්බර් 31 දින වන විට, 2021 වසරේ සිදු වූ රු.144,300 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් අස්ථානගතවීම සම්බන්ධයෙන් මූලික විමර්ශන සඳහා කමිටුවක් පත් කිරීම හැර ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තොරතුරු ලැබුණු වහාම මූලික විමර්ශන කමිටුව පත් කරන ලදී. නමුත් පරීක්ෂණ අවසන් කිරීමට නොහැකි විය. එය ඉදිරි මාස දෙකක කාලයක් තුළ අවසන් කෙරේ. | හානි හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවලට අනුව පියවර ගත යුතුය. |
| | (ii) මු.රෙ. 502(2) | ඉන්වෙන්ට්‍රි අයිතම සහ ස්ථාවර වත්කම් ලබා ගැනීමේදී සහ නිකුත් කිරීමේදී නිකුත් කළ යුතු ලැබීමේ රිසිට්පත සහ නිකුත් කිරීමේ නියෝගය ව්‍යාපෘතියේ ආරම්භයේ සිට භාවිතා කර නොමැත. තවද ස්ථාවර වත්කම් ලේඛනයක් ව්‍යාපෘතිය මගින් නඩත්තු කර නොතිබුණි. | නිරීක්ෂණය සමග එකඟයි. නියෝග නිකුත් කිරීමට අදාළ ක්‍රියාවලියක් නිවැරදි කර ඇත. ව්‍යාපෘතිය මගින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොමැත. | ඉන්වෙන්ට්‍රි අයිතම ලැබීම සහ නිකුත් කිරීම අනුව වාර්තා තබා ගත යුතුය. |
| | (iii) මු.රෙ. 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත් කිරීම සෑම වසරකම දෙසැම්බර් 15 හෝ ඊට ආසන්න දිනකදී සිදු කළ යුතු නමුත්, දේපල, පිරියත සහ උපකරණවල වටිනාකම රු. මිලියන 95 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත් කර නොතිබුණි. සමීක්ෂණ මණ්ඩලයේ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නිරීක්ෂණය සමග එකඟයි. මගේ අංක MOA/CSIAP/PMU/FM/ 39.I සහ 2023-01-02 දිනැති ලිපියට අනුව, සමීක්ෂණ රාජකාරි සඳහා වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය පත් කර ඇත. ව්‍යාපෘතියට ස්ථාවර වත්කම් ලේඛනයක් නොමැති නමුත් අනෙකුත් ලේඛන පවත්වාගෙනෙ යනු ලැබේ. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මුදල් රෙගුලාසිවලට අනුව සිදු කළ යුතුය. |
| (ආ) | 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු (PSC) මාස දෙකකට වරක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ පවත්වා ඇත්තේ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් තුනක් පමණි. | මෙම කමිටුව කැඳවීමේ බලය සහ වගකීම පැවරෙන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශයටය. ඒ සඳහා අමාත්‍යාංශය අවස්ථා කිහිපයක් ලබාදී තිබුණි. එම අවස්ථා අනුව අදාළ රැස්වීම් පවත්වා ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව ක්‍රියා කළ යුතුයි. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්හි ප්‍රගතිය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මේ සියලුම ක්‍රියාකාරකම් 42 න්, 2022 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරකම් 14 ක් සියයට 50 ක් සහ සියයට 50 ට අඩුවෙන් සම්පූර්ණ කර තිබුණි. | එම කටයුතු කෙරී ගෙනයමින් පවතී. පුහුණු වැඩසටහන්වල දුර්වලතා සහ නිසි සැලසුම් නොකිරීම හේතුවෙන් ඒවා ප්‍රමාද විය. | ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනාගත යුතුයි. නියමිත කාල සීමාව තුළ පුහුණුවීම් අවසන් කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මේ සියලුම ක්‍රියාකාරකම් 42 න් 6 ක් 2022 දෙසැම්බර් 31 දිනට සියයට 51 සිට සියයට 75 දක්වා පරාසයක නිම කර තිබුණි. | එම කටයුතු කෙරී ගෙනයමින් පවතී. පුහුණු වැඩසටහන්වල දුර්වලතා සහ නිසි සැලසුම් නොකිරීම හේතුවෙන් ඒවා ප්‍රමාද විය. | ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනාගත යුතුයි. නියමිත කාල සීමාව තුළ පුහුණුවීම් අවසන් කළ යුතුය. |

### 3.2 ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| මුලතිව් දිස්ත්‍රික්කයේ සහ මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන නවීකරණය සඳහා 2020 ඔක්තෝම්බර් 28 වැනි දින ව්‍යාපෘතිය මගින් අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි. නමුත් ගොවිජන සේවා මධ්‍යස්ථාන නවීකරණය සිදු කර නොතිබුණි. | මුලතිව් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන නවීකරණය විවිධ හේතු නිසා ප්‍රමාද වී ඇත. මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල, වැල්ලවාය සහ තෙලුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථාන 03ක් සඳහා පැකේජයක් ලෙස කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත. තෙලුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ යෝජිත ඉදිකිරීමට මාර්ග ප්‍රවේශයක් නොමැතිකම සහ ඉදිකිරීම් භූමිය වැසි ජලයෙන් යටවීම නිසා සිදු කර නොමැත. ඉන් පසු වෙනත් ස්ථානයක ඉදිකිරීමට සැලසුම් කර තිබුණත් අනුමැතිය නොලැබීම නිසා එය ඉදිකිරීමට නොහැකි විය. කෙසේ වෙතත්, ඉහත සඳහන් මුදල ඉතිරි ගොවිජන සේවා මධ්‍යස්ථාන දෙකේ ගෙවීම්වලින් කපා හැර ඇත. | ව්‍යාපෘතියේ කර්තව්‍යයන් නිසි ලෙස සැලසුම් කර ඒවා සාක්ෂාත් කර ගත හැකි ආකාරයට කළමනාකරණය කළ යුතුය. |

### 3.3 මතභේදාත්මක ගනුදෙනු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය විසින් රු. මිලියන 24.5 ක් වටිනා Intel core i7 සහ 16 GB මතකය (16 GB memory) සහිත උසස් තත්ත්වයේ ලැප්ටොප් පරිගණක 48 ක් තාක්ෂණික නිලධාරීන් (TO), ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරීන් (STO) සහ ඉංජිනේරුවන්ගේ නිල භාවිතය සඳහා මිල දී ගෙන තිබුණි.එම ලැප්ටොප් පරිගණක 48 න් 33 ක් අරමුණින් බැහැර වෙනත් තනතුරු අතර බෙදා හැර ඇති බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සමග එකඟයි. මෙම පරිගණක දැනටමත් නිලධාරීන් විසින් අවශ්‍ය පරිදි භාවිතා කරන අතර සම්පත් අපතේ යෑමක් සිදුවී නොමැත. | නිසි සැලසුම් මත වත්කම් ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සඳහා වර්ග අඩි 7020කින් යුත් ගොඩනැගිල්ලක් බද්දට ගෙන තිබුණු අතර විගණනය කරන ලද දිනය වන 2023 මැයි 15 දින වන විට රජයේ තක්සේරුකරුගේ වාර්තාව උල්ලංඝණය කරමින් සහ ගොඩනැගිල්ලේ වෙළඳපොළ වටිනාකම ඉක්මවා යාම හේතුවෙන් ව්‍යාපෘතිය විසින් රු. 960,000ක අතිරේක ගෙවීමක් කර තිබුණි.මෙම ගොඩනැගිල්ල සේවකයින් 32 දෙනෙකු විසින් පමණක් භාවිතා කරනු ලබන අතර එක් පුද්ගලයෙකුගේ භාවිතය වර්ග අඩි 219 ක් පමණ වේ.එමෙන්ම බොරැල්ල - බත්තරමුල්ල ප්‍රධාන මාර්ගයේ සිට කිලෝමීටර් 4ක් පමණ දුරින් පිහිටි මෙම ගොඩනැගිල්ල නිසා වැඩි කාලයක් ගත කිරීමට සිදු වන අතර අමතර වියදම් දැරීමට සිදුවේ. | වාහන 10ක් පමණ නැවැත්වීමේ පහසුකම් සහිත ඉඩකඩක් තිබීම සහ වර්ග අඩි ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් අදාළ ගෙවීම් සිදු කර ඇත. රු.660,000 යනු ගොඩනැගිල්ලේ වර්ග අඩියට අදාළ වටිනාකම පමණි.<br>ඉහත සඳහන් කළ මිල ගණන් සහ පහසුකම් සහිත එම ගොඩනැගිලි බොරැල්ල සහ බත්තරමුල්ල අවට සොයාගත නොහැකි බව කරුණාවෙන් සලකන්න. | වත්කම් අත්පත් කර ගැනීම සහ ගිවිසුම්වලට එළඹීම වඩාත් ඵලදායී, නිවැරදිව සහ අවම ප්‍රවාහන පිරිවැයකින් සිදු කළ යුතුය. |
| (ඇ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගෙවතු වගා වැඩසටහන සඳහා කහ, ඉඟුරු සහ පලතුරු පැළ කට්ටල 15,762ක් මිලදී ගෙන බෙදා හැරීමේ ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමට අදාළව තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශ නොමැතිව රු. මිලියන 12.9 ක අවම ලංසුව ප්‍රතික්ෂේප කිරීම සහ ලංසුකරුවන් දෙදෙනෙකුට රු. මිලියන 20.5කට ප්‍රසම්පාදනය පිරිනැමීම හේතුවෙන් රු. මිලියන 7.6ක අලාභයක් සිදුවී තිබුණි. තවද, ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයින් තිදෙනාගෙන් එක් අයෙකු ප්‍රසම්පාදන ප්‍රදානයට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. ප්‍රසම්පාදන තීරණයට අත්සන් නොකළ සාමාජිකයාගේ අත්සන ව්‍යාජ ලෙස සකස් කර ඇති බවත් ඒ පිළිබඳව අමාත්‍යාංශ ලේකම්වරයා කිසිදු පරීක්ෂණයක් සිදු කර නොමැති බවත් සාමාජිකයා විසින් 2021 නොවැම්බර් 21 දින අමාත්‍යාංශ ලේකම්වරයාට ලිඛිතව පැමිණිලි කර තිබුණි. ප්‍රසම්පාදන තීරණය ව්‍යාජ එකක් බවට ලේකම්වරයාට දැනුම් දීමෙන් පසු අත්සන් දෙකක් පමණක් සහිතව ප්‍රසම්පාදන තීරණය ප්‍රකාශයට පත්කර තිබුණි. මූල්‍ය රෙගුලාසි 135(2) ට පටහැනිව ප්‍රසම්පාදන තීරණයට එක අත්සනකින් තොරව කුරුණෑගල ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් ගෙවීම් කර ඇති බවද නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයින් තිදෙනාගෙන් එක් අයෙකු එකඟ නොවන්නේ නම්, එවැනි අවස්ථාවක, ප්‍රසම්පාදනය ඉදිරියට ගෙන යා හැකිය. එම කටයුතු සිදු නොකිරීමෙන් එම නිලධාරියා තම වගකීම් පැහැර හැර ඇත.<br>මෙ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකවරයෙකු විසින් නිකුත් කර ඇති වාර්තා මගින් මූලික විමර්ශන සිදු කරන ලෙස නිර්දේශ කර ඇත. ඒ නිර්දේශ මත අප මූලික විමර්ශන කමිටුවක් පත් කර තිබේ. | ව්‍යාපෘතිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල උපදෙස් අනුව හා රජයට කාර්යක්ෂමතාවය උපරිම වන අයුරින් ක්‍රියා කළ යුතු අතර වගකිවයුතු පාර්ශවයන්ගෙන් හානි අයකර ගත යුතුය. |
| (ඈ) | ප්‍රසම්පාදනය සඳහා තෝරාගත් සැපයුම්කරු කිලෝ ග්‍රෑම් 25 කොම්පෝස්ට් පොහොර බෑග් එකක් ප්‍රවාහනය සහිතව රු.490 ට සැපයීමට එකඟ වී තිබුණත් අදාළ පොහොර තොගය ලබාදීමට තම ආයතනයට හැකියාවක් නොමැති බව 2022 අගෝස්තු 14 දින දන්වා තිබුණි. 2022 අගෝස්තු 16 දින ප්‍රසම්පාදන කමිටුව අදාළ තීරණය යලි ඇගයීමට ලක් කර තිබුණි.පළමුව තෝරා නොගත් | මෙ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකවරයෙකු විසින් නිකුත් කර ඇති වාර්තා මගින් මූලික විමර්ශන සිදු කරන ලෙස නිර්දේශ කර ඇත. ඒ නිර්දේශ මත අප මූලික විමර්ශන කමිටු පත් කර තිබේ. විමර්ශන කමිටු වාර්තාව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතු අතර රජයට කාර්යක්ෂමතාවය උපරිම වන පරිදි ක්‍රියා කළ යුතු අතර වගකිව යුතු පාර්ශවයන්ගෙන් |

| | | | |
|---|---|---|---|
| | සැපයුම්කරුට දෙවනවර ඇගයීමේ ක්ෂේත්‍රයේ පිළිබඳ පළපුරුද්දක් ඇති බව සඳහන් කරමින්, වෙළඳපොළ පවතින මිල ගණන් නොසලකා හෝ නැවත මිල කැඳවීමක් නොකර කි.ග්‍රෑ. 25 ක පොහොර බෑගයක් රු. 950 බැගින් මිලට ගැනීමට ලංසුව පිරිනමා තිබුණි.<br><br>**I.** අවස්ථා 03 කදී අදාළ පොහොර තොගය සපයා තිබුණු අතර දෙවන අවස්ථාවේ සපයන ලද පොහොර බෑග් 7,964 ක් වූ තොගයට ගෙවීම් කිරීමට පෙර පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද විශ්ලේෂණ වාර්තාව (SLS.1635:2019) අනුව ප්‍රමිතීන් (Parameters) SLS අගයට අනුකූල නොවන බව සඳහන් කර තිබුණු අතර එම දැනුම්දීම නොසලකා මුළු පොහොර ප්‍රමාණය සඳහා රු.14,973,900 ක් ගෙවීම් කර තිබුණි.<br><br>**II.** මෙම පොහොර තොගය ලබාදුන් ගොවීන් තෝරාගත් පදනම හා නිකුත් කළ ගොවියන්ගේ නාම ලේඛනය, අත්සන් ලේඛන ඉදිරිපත් නොකළ අතර තොග පොත් වලද ඇතුළත් කර නොතිබුණි. | ලැබුණු පසු මම මේ සඳහා පිළිතුරු ලබා දෙමි. | හානි අයකරගත යුතුය. |
| (ඉ) | අනුරාධපුර රනෝරාව, මහානිකවැව කඩිනම් කෘෂිකර්ම වැඩසටහන යටතේ එක් ගොවියෙකුට අක්කර ¼ ක භූමි ප්‍රමාණයක් බැගින් මිරිස් වගාවක් කිරීම සඳහා ගොවීන් 19 දෙනෙකු තෝරාගෙන එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 2.7ක වියදමක් දරා තිබුණි. නමුත් ව්‍යාපෘතිය භෞතිකව පරීක්ෂා කරන විට, එක් ගොවියෙකු පමණක් මිරිස් වගාවේ නියැළෙමින් සිටි අතර අනෙක් ගොවීන් 18 දෙනා මිරිස් වගාවෙන් ඉවත්ව ගොස් තිබුණි. මේ අනුව දරන ලද වියදම නිෂ්කාර්ය වී තිබුණි. | නිරීක්ෂණය සමග එකඟයි. ප්‍රථමයෙන් ගොවීන් 19 දෙනෙකුට මිරිස් වගාව පිළිබඳ පුහුණුව ලබා දෙන ලදී. ඉන් පසුව ඔවුන් මිරිස් වගාවට යොමු කරන ලදී. සුදු මැස්සන් මිරිස් වගාවට හානි කළ නිසා වගාව විනාශ විය. ඊට අමතරව පොහොර හිඟය නිසා ගොවීන් මිරිස් වගාව අතහැර වෙනත් වගාවන් වෙත යොමු විය. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර නිසි සැලසුමක් කළ යුතුය. ප්‍රතිලාභීන්ට නිවැරදි උපදෙස් ලබා දිය යුතු අතර අධීක්ෂණය නිසි ලෙස සිදු කළ යුතුය. |
| (ඊ) | අනුරාධපුර රනෝරාව, මහානිකවැව කඩිනම් කෘෂිකර්ම වැඩසටහන යටතේ අක්කර ½ බැගින් ගොවීන් 16 දෙනෙකුට අඹ වගාව සඳහා රු. 244,208 ක් වැය කර තිබුණු අතර, දොඩම් වගාව සඳහා එක් ගොවියෙකුට අක්කර ½ බැගින් ගොවීන් 44 දෙනෙකුට රු.828,100 ක් ද, පේර වගාව සඳහා ගොවීන් දෙදෙනෙකු වෙනුවෙන් රු. 160,866 ක මුදලක්ද වැය කර ක්‍රියාත්මක කරන ලදි. නිවැරදි උපදෙස් නොලැබීම හා පසු විපරම් කටයුතු නොකිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘති අසාර්ථක වී තිබුණි. | අභ්‍යන්තර විගණකවරයා විසින් පෙන්වා දෙන ලද නිරීක්ෂණ සඳහා දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම ගැටළුවලට අදාළ ලිපිගොනු සහ ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව පැහැදිලි කිරීම් කඩිනමින් ලබා දීමෙන් පසු සම්පූර්ණ පිළිතුරක් එවනු ලැබේ. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර නිසි සැලසුමක් කළ යුතුය. ප්‍රතිලාභීන්ට නිවැරදි උපදෙස් ලබා දිය යුතු අතර අධීක්ෂණය නිසි ලෙස සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | උතුරු මැද පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති කාර්යාලය විසින් රජයේ බීජ ගොවිපලින් ණය පදනම මත මිලදී ගත් මුං බීජ කිලෝ ග්‍රෑම් **3,000** න් කිලෝ ග්‍රෑම් **1,175** ක් නිකුත් කිරීම පිළිබඳ වාර්තා හෝ ලිඛිත සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයා විසින් පෙන්වා දෙන ලද නිරීක්ෂණ සඳහා දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම ගැටළුවලට අදාළ ලිපිගොනු සහ ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව පැහැදිලි කිරීම් කඩිනමින් ලබා දීමෙන් පසු සම්පූර්ණ පිළිතුරක් එවනු ලැබේ. | නිවැරදිව වාර්තා තබා ගත යුතු අතර වගකිව යුතු පාර්ශවයන්ගෙන් වාර්තා නොකළ අගයන් සඳහා අයකර ගත යුතුය. |

**3.4** මානව සම්පත් කළමනාකරණ ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| කාර්ය මණ්ඩල සාමාජිකයින්ට රාජකාරි ලැයිස්තු නිකුත් කර නොමැති බව නිරීක්ෂණය විය | ව්‍යාපෘතියේ විෂය විශේෂඥයින් **33**ක් (**PS 1** සිට **PS 3** දක්වා) සේවය කරන අතර ඔවුන් සියල්ලන්ටම රාජකාරි ලැයිස්තු ඇත. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා **2023** ජූනි **6** ට පෙර අදාළ කාර්ය මණ්ඩලය වෙත රාජකාරි ලැයිස්තු ලබා දෙන ලෙස අදාළ අංශවල විශේෂඥයන්ට උපදෙස් දී ඇත. | සියලුම සේවකයින්ට රාජකාරි ලැයිස්තු ලබා දිය යුතුය. |